**ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

--------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්"මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

-----------------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 42 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති රු.118,207,445ක්වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් එම වත්කම් තව දුරටත් භාවිතා කරන නමුත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 අනුව මෙකී ඇස්තමේන්තුගත දෝෂය නැවත නිවැරදි කර ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ගොඩනැගිලි හැර සියළුම වත්කම් මේ වන විට නැවත අගය කර ඇති අතර ඒවා සියල්ල 2019 අවසාන ගිණුම් තුලින් ගැලපීම කෙරේ | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) සමාලෝචිත වර්ෂයේ නුඩ්ලස් යන්ත්‍රාගාරය විකිණීමෙන් ලද රු.3,058,500 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලාඒම් ලෙස දැක්විය යුතු වුවද එලෙස දක්වා නොතිබුණි. එසේම ප්‍රාග්ධන අරමුදල් ලැබීම් රු.18,006,533 ක් වුවද මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ප්‍රාග්ධන අරමුදල් ලැබීම් රු.20,029,336 ක් ලෙස දැක්වීමෙන් මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 2,022,803ක් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම මුදල මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු මුදලක් ලෙස ගෙවිය යුතු වටිනාකම් යටතේ දක්වා ඇති අතර ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමේදී නිවැරදි කරමි. | නිවැරදි මුදල් ප්‍රවාහයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුය. |
| ආ) සමාලෝචිත වර්ෂයේ අදායම තුළ ක්‍රමක්ෂය ලෙස රු.27,020,326 ක් දක්වා තිබුණ ද එය ගණනය කිරීමේදී අදාල කර නොගතයුතු ප්‍රත්‍යාගණනය කළ වාහනවලට අදාළ ක්ෂය වීම් වන රු. 7,963,000 ක් ද ඇතුළත් කර තිබුණි. | ප්‍රත්‍යාගණනය කල වාහන වලට අදාල ක්ෂයවීම් ප්‍රමාණය සම්චිත අරමුදලට නැවත ගැලපීම් කිරීමට කටයුතු කරමි. | ක්‍රමක්ෂය සඳහා අදාළ කරගත යුතු වත්කම්වලට අදාළ ක්ෂයවීම් පමණක් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| ඇ) සමාලෝචිත වර්ෂයේදී රු.10,290,742 ක් වටිනා රසායනාගාර ද්‍රව්‍ය, ගබඩාවෙන් රසායනාගාරය වෙත නිකුත් කර තිබුණද, දෙසැම්බර් 31 දිනට රසායනාගාරයේ පැවති තොගය ගණනය කර වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | රසායනාගාරයට නිකුත් කරන ද්‍රව්‍ය වියදම් ලෙස සලකා ගිණුම්ගත කිරීම දැනට ආයතනය විසින් අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය වේ. | රසායනාගාරය තුළ දෙසැම්බර් 31 දිනට භාවිතා නොකළ තොගයෙහි වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| ඇ) සමාලෝචිත වර්ෂයේදී පිරිවැය රු.29,110,000 ක් වූ නුඩ්ලස් යන්ත්‍රයක් විකිණීමෙන් ලද රු.3,058,500ක මුදල වත්කම විකිණීමට අදාළව ලාභ පාඩු ගණනය කිරීමෙන් තොරව ජංගම වගකීම් තුළ දක්වා තිබුණි. | 2018 වර්ෂයේදී නුඩ්ල්ස් යන්ත්‍රය විකිණීම සිදු කලද ඊට අදාල ලාභපාඩු ගණනය කිරීම හා වත්කම් ඉවත් කිරීමේ කාර්යය ප්‍රවර්ථන වර්ෂයේදී සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | වත්කම් විකිණීමේ ලාභ/පාඩු හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. | අනුරූපී වාර්තා අනුව ශේෂය රු. | වෙනස රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| පොදු අරමුදල සමුච්චිත ඌනතාවය | 131,636,167<br>98,340,039 | 114,690,472<br>83,101,167 | 16,945,695<br>15,238,872 | පොදු අරමුදලෙහි සහ උපයන විට ගෙවීම් බදු/රඳවා ගැනීමේ බදු ගිණුමේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂය නිවැරදි අතර ලෙජරයේ සටහන් වැරදී තිබුණි. සමුච්චිත ඌණතාවයෙහි මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය නිවැරදි වේ. | ලෙජර ගිණුම් ශේෂය හා මූල්‍ය ප්‍රකාශන ශේෂය සමාන විය යුතුය. |
| උපයන විට ගෙවීම් බදු/ රඳවා ගැනීම් බදු | 303,612 | 117,476, | 186,136 | | |

### 1.5.4 අවිනිශ්චිත ගිණුම්

| විෂයය | මුදල රු. | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අවිනිශ්චිත ගිණුම | 201,091 | වසර 03 | අදහස් දක්වා නැත | වෙනස්කම් හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට හෝ ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් අයිතම 03ක් සඳහා එකතුව රු.27,500,000ක් ඇස්තමේන්තුගතව තිබුණු නමුත් එම ඉලක්කයෙන් ලඟාකර ගැනීමට හැකිව තිබුණේ රු.1,515,632ක් පමනක් වීමෙන් රු.25,984,368ක ආදායමක් රැස්කර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි. | මෙම තත්ත්වය ඇතිවීමට හේතු වී ඇත්තේ ආදායම් වර්ග 03ක් ඇස්තමේන්තු ගත කළ ආකාරයට ක්‍රියාත්මක නොවීම නිසා බව සඳහන් කරමි. | නිසි අධ්‍යයනයකින් පසුව නිවැරදි තොරතුරු මත අයවැය ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 සිට 2016 දක්වා කාල පරාසයක් තුළ අයවිය යුතු එකතුව රු.993,158ක්වූ ශේෂ 02 ක් ගිණුම්වල පවතින අතර මෙම ශේෂ තුළ දැනට සේවයේ සිටින නිළධාරීන් මෙන්ම මිය ගිය පුද්ගලයින්ද සිටින බව නිරීක්ෂණය විය. මෙම ශේෂ හඳුනා ගෙන නිරවුල් කිරීමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාර ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | මහවැලි අමාත්‍යාංශයෙන් ලැබියයුතු ශේෂයට ලිඛිතව විමසීම් කර ඇති බවත්, ණයගැති පාලන ගිණුමේ ශේෂයන් පහසුවෙන් සොයා ගැනීමේ හැකියාවක් නොමැති බැවින් පරීක්ෂා කර බලා නිරවුල් කිරීමට කටයුතු කරමි. | දීර්ගකාලීනව අය නොවී පවතින ශේෂ නොපමාව අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) 2011 සිට 2017 දක්වා කාල පරාසයක් තුළ නිරවුල් නොවී පවතින එකතුව රු.695,730 ක් වූ ශේෂ 03ක් ගෙවා අවසන් කිරීමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි | ඉදිරියේදී නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. | දීර්ගකාලීනව නිරවුල් නොවී පවතින මෙම ශේෂ නොපමාව නිරවුල් කිරීමට හෝ වගකීමක් නොමැති නම් ආදායමට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ආ) සංවර්ධන ව්‍යාපෘති යටතේ සහන පදනම මත ප්‍රතිලාභීන් වෙත ලබාදුන් වී තම්බන ඇලුමිනියම් උපකරණ විකිණීමෙන් ලද රු.4,318,284ක්වූ ප්‍රතිලාභී දායක මුදල් රේඛීය අමාත්‍යාංශය වෙත ගෙවීමෙන් තොරව 2009 වර්ෂයේ සිට බැරකමක් ලෙස පැවතුණි. | මූල්‍ය තත්වය අනුව ඉදිරියේදි ගෙවිමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | වසර 09ක කාලයක් තුළ පියවා නොමැති මෙම ශේෂය කඩිනමින් පියවීමට කටයුතු කළ යුතුය |
| ඇ) සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.4,929,799 ක් වූ අබලි ද්‍රව්‍ය විකිණීමෙන් සහ බැඳුම්කර කඩවීම සම්බන්ධව ලද මුදල ඒකාබද්ධ අරමුදල වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය තත්වය අනුව ඉදිරියේදි ගෙවිමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මෙම මුදල් නොපමාව ඒකාබද්ධ අරමුදල වෙත යැවීමට කටයුතු කළ යුතුය |

### 1.6.3 අත්තිකාරම්

---------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.99,996ක්වූ වසර 02 සිට 15 දක්වා කාල පරාසයක් තුළදී ගෙවා තිබූ ගමන් වියදම් අත්තිකාරම් අතුරු අග්‍රිම සහ ප්‍රධාන කාර්යාලයේ අතුරු අග්‍රිම ශේෂ නිරවුල් කරගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | අතුරු අග්‍රිම ගිණුමේ ශේෂය අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතුකර ඇති අතර අනෙක් ශේෂ පහසුවෙන් සොයා ගැනීමේ හැකියාවක් නොමැති බැවින් ඒවා පරීක්ෂා කර බලා නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. | කාලයක් ඉක්මවා ඇති මෙම අත්තිකාරම් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---------------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>අංක 1645 | වාහන භාවිත කිරීමේදී රාජකාරිය සඳහා යොදාගන්නා නිලධාරින් විසින් ධාවන සටහන්වල අත්සන් කළයුතු වුවද, වාහන දෙකක් පාවිච්චි කළ නිලධාරින් විසින් අවස්ථා 28 කදී අත්සන් තබා නොතිබුණි. | මෙම තත්වය නිවැරදි කිරීමට රියදුරු මහතුන් සහ නිලධාරීන් දැනුවත් කර ඇත | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2015 ජූලි 14 දිනැති අංක 2015/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අදාළ කාර්යය නිමවී දින 10ක් ඇතුළත අත්තිකාරම් පියවිය යුතු වුවද, අවස්ථා 17කදී ලබාගත් අත්තිකාරම්, මාස 01 සිට මාස 6 ½ දක්වා කාල පරාසයක් තුළ ප්‍රමාද වී පියවා තිබුණි. | ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලින් වැඩි ප්‍රමාණයකට අදාළ කාර්යන් අත්තිකාරම් සිදුවේ. එමෙන්ම අධ්‍යයන හා පර්යේෂණ ගණයේ සිටින සියලුම නිලධාරීන් අත්තිකාරම් ගනු ලබන අතර, ඔවුන්ගේ කාර්යන් කිහිපයක් ඇති විට අත්තිකාරම් කිහිපයක්ද ගනු ලබන අතර සමහර අවස්ථා වලදී ප්‍රමාද වී පියවා ඇති බවත් මෙම තත්ත්වය අවම කර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි . | ලබාදුන් අත්කාරම් නොපමාව අයකර ගැනීමට නිසි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.15,238,872 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 8,193,073ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,045,799ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේ ආදායම වැඩි වී තිබුණද, සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා සේවා වියදම සහ විවිධ වියදම් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

--------------------------

ඉකුත් වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 1:1.22ක්වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය 1: 0.96ක් ලෙස පිරිහී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව උපචිත වියදම සියයට 26 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) 2015 මැයි 25 දිනැති පීඒඩී 01/2015 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහනයක් වෙන්කිරීමට හිමිකම් නොමැති, විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුට ආයතනයේ ආදායම් ප්‍රවර්ධන කාර්යයන් වෙනුවෙන් මසකට ඉන්ධන ලීටර් 150ක් සමග වාහනයක් වෙන්කරදීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. එහෙත් ආදායම් ප්‍රවර්ධන කාර්යයන් සහ ආදායම් ඉලක්ක ද ලබා දී නොතිබුණු අතර ඔහු වෙනුවෙන් වාහන නඩත්තු, ඉන්ධන හා රියදුරුගේ වැටුප් සහ දීමනා ලෙස 2017 අප්‍රේල් සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.1,540,869ක් ආයතනයේ අරමුදලින් දරා තිබුණි. | 2017 ජූලි මස 14වන දින පැවති 138 වන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ආදායම් උත්පාදන කමිටුවේ සභාපති ලෙස ප්‍රියන්ත ජයතිස්ස මහතා පත් කර ඇත. ඒ අනුව ඔහු විසින් ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් අධීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා කරන ලද ඉල්ලීම් අනුව 140 වන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාස 6ක කාලයක් සඳහාද, 143 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පෙර වසරේ වාහන උත්පාදනය සලකා බලමින් නැවත වාහනය ලබාදීමට අනුමැතිය ලබාදී ඇත. | ආදායම් ඉලක්ක මොනවාද යන්න කාර්ය පැවරුමක් මගින් ලබාදී, රාජකාරී ඉටුකිරීම සඳහා පමණක් වාහනයක් වෙන්කරදීමට කටයුතු කළ යුතුය. එසේම මේ සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |
| ආ) ආයතනයේ ජ්‍යොෂ්ඨ පර්යේෂණ නිළධාරියකු ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා 2006 ජූලි 23 සිට 2009 ජූලි 29 දක්වා රු.1,998,980ක බැඳුම්කරයක් මත වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබූ අතර අත්සන් කරන ලද බැඳුම්කරයට අනුව 2009 ජූනි 29 සිට 2019 ජූනි 29 දක්වා නැවත | අතිරේක අධ්‍යක්ෂ (පාලන හා මූල්‍ය) පෞද්ගලිකව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ගොස් මේ සම්බන්ධව සොයා බලා ඇති අතර මෙම කටයුත්ත නීති අංශයට යොමු කර ඇති බවත් විස්තර ලද විගස ආයතනය වෙත දැනුම් දෙන බවත් දැනුම් දී ඇත. | බැඳුම්කරය කඩවීමෙන් ආයතනයට සිදුවූ පාඩුව අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය |

| | | |
|---|---|---|
| ආයතනයේ සේවය කල යුතු වුවද ආචාර්ය උපාධිය හැදෑරීම අවසන් කර 2009 ජුනි 29 දින සේවයට වාර්තා කර රාජකාරී කර තිබූ නමුත් ඉදිරි වසර 10ක් සේවය නොකර 2016 ජනවාරි 07 දින සේවය හැරගොස් තිබුණි. එහෙත් ඉහත බැඳුම්කරය කඩවීමෙන් ආයතනයට සිදුවූ පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| ඇ) පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය තුළ ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා කිසිදු සේවා කාණ්ඩයක් සඳහා අනුමත බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා නොතිබුණු අතර පරිවාස කාලයේ සිටින නිළධාරීන් වසර 03ක සේවය ඉක්ම වූ පසු සේවය ස්ථිර කිරීම්, උසස් කිරීම්,වැටුප් වර්ධක ලබා දීම් අඛණ්ඩව සිදුකර තිබුණි. | ආයතනයේ නව සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද විධායක කමිටු රැස්වීමේදී මේ සම්බන්ධව සාකච්ඡා කල අතර අප ආයතනයේ සුලු සේවක පිරිසක් සිටින බැවින් රජයේ විභාග දෙපාර්තමේන්තු මගින් පවත්වනු ලබන විභාග සඳහා ආයතනයේ සේවකයින්ද සහභාගිවීමේ හැකියාව සාකච්ඡා කරන ලදි. මේ සම්බන්ධව විභාග පවත්වන ආතනවලින් විමසීම් කර ඇති අතර පිළිතුරු ලද වහාම අවශ්‍ය කටයුතු කරමි. | මේ සම්බන්ධව අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවේද සාකච්ඡා කර ඇති බැවින් කාර්යක්ෂමතා කඩඉම් විභාග නොපමාව පැවැත්වීමට පියවර ගත යුතුය |
| ඇ) ආයතනයේ ගිණුම් තැබීමේ කටයුතු සඳහා රු. 240,000ක වියදමින් ස්ථාපිත කර තිබෙන ගිණුම්කරණ මෘදුකාංගය, වත්කම් සහ වගකීම් ඇතුළත් කිරීම, බැංකු සැසඳුම් ප්‍රකාශන සකස් කිරීම වැනි කරුණු සඳහා යොදාගෙන නොතිබුණි. | වර්තමානයේදී බැංකු සැසඳුම් ප්‍රකාශන සකස් කිරීම වැනි කටයුතු ආරම්භ කර ඇත. | ගිණුම්කරණ මෘදුකාංගය උපරිම ධාරිතාවයෙන් භාවිත කළ යුතුය |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය තෙක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ "ශ්‍රී ලංකාවේ කෘෂිබෝග වල සැපයුම් හා අගයදාම කළමණාකරණ ව්‍යාපෘතියේ වාර්ෂික ක්‍රියාකාරකම් සැලසුම් තෙවරක් සංශෝධනය කර තිබුණද ව්‍යාපෘතියේ මූලික ක්‍රියාකාරකමක් වන ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදනයන් සම්බන්ධව පවතින සැපයුම් දාමයන් හඳුනා ගැනීම සඳහා මූලික පරීක්ෂණ පැවැත්වීම සහ කෘෂි නිෂ්පාදන ක්‍රියාවලියේ නිවැරදි නොවන පසුඅස්වනු පරිහරණය තුළින් වන හානිය හඳුනා ගැනීමේ ක්‍රියාකාරකම් අවසන් සංශෝධිත ක්‍රියාකාරකම් සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | 2017 වර්ෂයේ පළවන ක්‍රියාකාරකමට අදාළව ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිළධාරීන් හරහා කෘෂි නිෂ්පාදන දත්ත ලබා ගැනීමේ කටයුතු අවසන් නොවුව ද ඊට අදාළ කටයුතු 2018 වර්ෂයේ පළවෙනි ක්‍රියාකාරකම යටතේ කරන ලදි. | වාර්ෂික ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී එම කාර්යයන් අරමුණුවලට අදාළව සිදුකළ යුතුය |

| | | |
|---|---|---|
| ආ) ගොවියාගේ සිට සිල්ලර වෙළෙන්දා දක්වා එළවළු හා පළතුරු ප්‍රවාහනය කරනු ලබන වාහන විශ්ලේෂණය කිරීමට රු.1,290,000 ක පිරිවැයක් දරා GPS Trackers Units 100ක් 2018 අප්‍රේල් 05 දින මිලට ගෙන තිබුණද විගණන දින වන 2019 නොවැම්බර් 15 දින වන විටත් එම උපකරණ වලින් 98ක් ම ගබඩාවේ පැවතුණු අතර, ඉතිරි GPS Trackers 2 වෙනත් පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා ලබාගෙන තිබුණි. එම උපකරණ සවිකිරීමකින් තොරව සවිකිරීමට අදාළ ගාස්තු වූ රු.600,000ක් ගෙවා තිබුණි. | GPS Trackers ක්‍රියාත්මක කිරිම සඳහා එම යන්ත්‍ර වලට Data sim සවිකල යුතු බවත්, ඒවා ජංගම දුරකථන ආයතනයකින් වෙනමම සපයා ගත යුතු බවත් , මෙම යන්ත්‍ර ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් Data sim මිලදි ගැනිමට කටයුතු ක්‍රියාත්මක කල අතර 2018.ඔක්තෝබර් මාසයේදී මිලදි ගැනිම් ඇණවුම යැව්වද, වර්ෂය අවසාන වන තෙක් සැපයුම සිදු නොවිනි.<br>අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. | නිවැරදි සැලසුම් සකස් කිරීම් සහ අවශ්‍යතාවයන් හඳුනාගෙන මිලදීගැනීම් සිදුකළ යුතුය |
| ඇ) රු.4,680,000ක් වැය කර temperature data loggers 100ක් සමාලෝචිත වර්ෂයේ මිලට ගෙන තිබු අතර ඉන් 70ක් ම විගණන දින වන විටත් ගබඩාවේ තිබූ අතර ගබඩාවෙන් නිකුත් කර තිබූ data loggers 30ම ලබා ගෙන තිබුණේ ආයතනයේ වෙනත් පර්යේෂණ ව්‍යාපෘති සඳහාය. මෙවැනි ඉතා සංවේදී ඉලෙක්ට්‍රොනික් උපකරණ ගබඩාවේ වර්ෂයකට වැඩි කාලයක් පැවතීමෙන් එහි ක්‍රියාකාරිත්වයට හානියක් සිදු වීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය. | මෙම උපකරණ මිලට ගෙන තිබුණේ ගොවියාගේ සිට සිල්ලර වොළන්දා දක්වා කෘෂි භෝග ප්‍රවාහනයේදී උෂ්ණත්වය විචලනය ආකාරය අ අධ්‍යයනය කිරීමටයිඑසේ වුවද, දත්ත ලබා ගැනීමේ අධ්‍යයන කටයුතු සැලකිය යුතු කාලයක් ප්‍රමාද විය.<br>. | නිවැරදි සැලසුම් සකස් කිරීම් සහ අවශ්‍යතාවයන් හඳුනාගෙන මිලදීගැනීම් සිදුකළ යුතුය |
| ඇ) පර්යේෂණ මාර්ගෝපදේශ සංග්‍රහයට ප්‍රකාරව සියළුම පර්යේෂණ ව්‍යාපෘති සඳහා මාස දෙකකට වරක් පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රගතිය පර්යේෂණ කමිටුව වෙත වාර්තා කල යුතු වුවද කෘෂි භෝගවල සැපයුම් හා අගයදාම කළමනාකරණ ව්‍යාපෘතිය මගින් අවසාන පර්යේෂණ ප්‍රගති වාර්තාවක් නිකුත් කර තිබුණේ 2018 දෙසැම්බර් මාසයේදී ය. තවද, 2019 වර්ෂය දක්වා මෙම ව්‍යාපෘතිය පැවතියද 2019 වර්ෂයේ ක්‍රියාත්මක වෙමින් පවතින පර්යේෂණ තුළ මෙම ව්‍යාපෘතිය අන්තර්ගත නොවූ අතර 2019 අයවැය තුළටවත් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රතිපාදන අවශ්‍යතාවක් නොතිබුණි. ඒ අනුව රු.7,292,832ක් වැය කරමින් සිදු කල ව්‍යාපෘතිය නිශ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය වීය. | මෙම උපකරණ මිලට ගෙන තිබුණේ ගොවියාගේ සිට සිල්ලර වොළන්දා දක්වා කෘෂි භෝග ප්‍රවාහනයේදී උෂ්ණත්වය විචලනය ආකාරය අ අධ්‍යයනය කිරීමටයිඑසේ වුවද, දත්ත ලබා ගැනීමේ අධ්‍යයන කටයුතු සැලකිය යුතු කාලයක් ප්‍රමාද විය.<br>. | අදාළ ව්‍යාපෘති වාර්තා නියමිත පරිදි ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඉ) පළතුරු ඉදවීමේ කාබනික ක්‍රම හඳුන්වාදීම ව්‍යාපෘතිය මගින් පළතුරු ඉදවීමේ ක්‍රම ප්‍රචලිත කරවීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම්, අවසාන වර්ෂයේ ක්‍රියාකාරකම් තුළ දක්වා තිබුණ ද ව්‍යාපෘතිය ආරම්භ කල වර්ෂයේදීම එනම් ව්‍යාපෘතියේ මුල් වර්ෂය තුලදීම රු.9,572,717 ක් වියදම් කරමින් ඊට අදාළ උපකරණ සියල්ල මිලට ගෙන තිබූ අතර එම උපකරණ සියල්ල භාවිත කර තිබුණේ ආයතනයේ වෙනත් පර්යේෂණ ව්‍යාපෘති සඳහාය. එමෙන්ම මෙම ව්‍යාපෘතිය සඳහා මිලට ගෙන තිබූ Desk top 10 ක්, Lap top 5ක් හා Tablets 5ක් මෙම ව්‍යාපෘතියට යොදා නොගෙන ආයතනයේ වෙනත් අංශ සඳහා යොදා ගෙන තිබූ බව නිරීක්ෂණය විය. | මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පර්යේෂක සේවයෙන් ඉවත් වූ අතර ඒ වන විට මෙම පර්යේෂණය අවසන් කර නොතිබුණි. මෙම පර්යේෂණය සඳහා ලබාගත් ප්‍රධාන උපකරණය වූයේ Gas Chromate graph(GC) යන්ත්‍රයයි. මෙම පර්යේෂණයේ වායු විශ්ලේෂණ සියල්ලම සිදුකරනු ලැබුයේ මෙම උපකරණය මගිනි. ඊට අමතරව පසු අස්වනු ගුණත්වය විශ්ලේශණය කෙරෙන සියළුම පර්යේෂණයන් සඳහා මෙම උපකරණය යොදා ගනිමින් පවති. | අවශ්‍යතාවයන් හඳුනාගෙන මිලදීගැනීම් සිදුකළ යුතුය |
| ඊ) එසේම ඉහත ව්‍යාපෘතියේ පර්යේෂණ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ව්‍යාපෘති වල ප්‍රගතිය මාස දෙකකට වරක් වාර්තා කල යුතු වුවත් මෙම ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් මාසයෙන් පසු විගණිත දින වන නොවැම්බර් 15 වන දින දක්වාම ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. මෙම පර්යේෂණයේ සොයා ගැනීම් සඳහා පේටන්ට් අයිතිය ලබා ගැනීම හා පර්යේෂණයේ ප්‍රතිඵල වාණිජ මට්ටමින් ප්‍රචලිත කිරීම අරමුණු කර රු.9,572,717ක් මෙම පර්යේෂණය සඳහා වැය කර තිබුණද වර්තමානය වන විට එහි ක්‍රියාකාරීත්වය හා භෞතික ප්‍රගතිය අඩු මට්ටමින් පවතින බව නිරීක්ෂණය විය. | පර්යේෂණ යොජනාවේ දක්වා තිබූ ආකාරයට අවසන් නිෂ්පාදනය සඳහා patent ලබා ගැනිම සිදු කල යුතු වුවත් පර්යේෂණ ප්‍රතිඵල මත අවසන් නිෂ්පාදන ක්‍රියාවලිය වානිජමය වශයෙන් ප්‍රචලිත කිරිම සඳහා ප්‍රමාණවත් නොවන බව නිරික්ෂණය විය. පර්යේෂණයේ සමස්ථ විද්‍යාගාර ක්‍රියාවලිය නිමකොට ඇත. | පර්යේෂණ මාර්ගෝපදේශ සංග්‍රහයට ප්‍රකාරව ව්‍යාපෘතිවල ප්‍රගතිය නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය |
| උ) කෘෂිකර්ම අමාත්‍යාශයේ ප්‍රතිපාදනය මගින් ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ආනයන කරනු ලබන ආහාර වර්ග 07ක බැර ලෝහ වර්ග 04ක් අන්තර්ගතව තිබේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ රු.1,956,120ක වියදමක් දරා නියැදි 500ක් පරීක්ෂා කර තිබුණි. එම පරීක්ෂාවන් ඇතුළත් ව්‍යාපෘති වාර්තාව අනුව ඇතැම් ආහාර ද්‍රව්‍යවල උපරිම ආරක්ෂක මට්ටම ඉක්මවා Cadmium, Arsenic and Leaf වැනි බැරලෝහ අන්තර්ගත බව කරන ලද පරීක්ෂාවෙන් තහවුරුකරගෙන තිබුණි. එසේ වුවද, එම වාර්තාවේ නිගමන හා යෝජනා අනුව බැරලෝහ අන්තර්ගත | ආනයනික ආහාර හා දේශීය ආහාරවල බැරලෝහ පරීක්ෂා කර ඒ පිළිබඳ අධ්‍යනයක් තුලින් ලැබෙන ප්‍රතිඵල හරහා කෘෂිකාර්මික වශයෙන් හා ආර්ථික වශයෙන් මෙම ව්‍යාපෘතිය 2017/2018 වසර දෙක සඳහා සැලසුම් කළද, 2017 වසරේදී පරීක්ෂා කල සාම්පල 500 ප්‍රතිඵල නිරීක්ෂණය කර මෙම ව්‍යාපෘතිය ඉදිරියට සිදු කිරීම වඩා යෝග්‍ය බව 2018 වසර සඳහා ව්‍යාපෘති යෝජනා පිළිබඳ සිදු කරන ලද සාකාච්ඡාවලදී තීරණය වුවද, 2018 වසර සඳහා ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එම ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක නොවිය | වාර්තාවේ නිගමන හා යෝජනා අනුව බැරලෝහ අන්තර්ගත ආහාර ද්‍රව්‍යයන් ඇති බවට තහවුරු කරගෙන ඇති බැවින් වගකිවයුතු සියළුම පාර්ශව වෙත නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමුකළ යුතුවේ. |

| | | |
|---|---|---|
| ආහාර ද්‍රව්‍යයන් පිළිබඳ වැඩිදුර පරීක්ෂාවක් ආයතනය විසින් සිදුකර ඒ සම්බන්ධව වගකිවයුතු සියළුම පාර්ශව වෙත නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා තොරතුරු ලබාදී නොතිබුණි. ඒ හේතුවෙන් පර්යේෂණ සඳහා වැය වූ මුදල නිශ්කාර්ය වියදමක් බව විගණනයට නිරීක්ෂණය විය. තවද මෙම ව්‍යාපෘතියේ වියදම් වෙනුවෙන් රු.5,350,000ක මුදලක් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූරණය කරගෙන තිබුණි. | | |
| ඌ) ආයතනය සතු රසායනාගාරය ජාත්‍යන්තර තත්ත්වයේ පිළිගත් රසායනාගාරයක් ලෙස නවීකරණය කිරීම සඳහා 2015 වර්ෂය තුළ රුපියල් මිලියන 61.6 ක් වියදම් දරා උපකරණ මිලදී ගෙන රසායනාගාරය නවීකරණය කර තිබූ නමුත් එම රසායනාගාරය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව පර්යේෂණ සිදු කිරීම සඳහා අවශ්‍ය ජාත්‍යන්තරව පිළිගත හැකි සහතික (accreditation) ලබාගෙන නොතිබීම හේතුවෙන් මෙම ආයතනය විසින් සිදු කරනු ලබන පර්යේෂණ සඳහා පිළිගත හැකිභාවයක් ලබාගැනීමට අපොහොසත් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයට (2018/2019) දෙවතාවක් යන්ත්‍ර සේවාකිරීම සඳහා රු.1,236,664කට ගිවිසුම්ගතව තිබුණද, මෙතෙක් සේවා කටයුතු නොකිරීම හේතුවෙන් යන්ත්‍රවල ක්‍රියාකාරිත්වයට සහ පැවැත්මටද බාධාවිය හැකි බව නිරීක්ෂණය විය. | අත්‍යවශ්‍ය නවීන උපකරණ කිහිපයක් මිලදී ගැනීම සහ රසායනාගාරය නවීකරණය කිරීම 2015 වසරේදි සිදුකරන ලදි. මෙහි සිදු කරනු ලබන පර්යේෂණවලට අදාළ පර්යේෂණ පත්‍රිකා දේශීය මෙන්ම Elsevier වැනි ලොවම පිළිගත් ජාත්‍යන්තර සඟරා ආදියේද පල වී ඇත. නමුත් ශ්‍රී ලංකාවේ සිට විදේශ රටවලට අපනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍ය ආදිය සඳහා එම රටවල අවශ්‍යතාවය මත Accreditation සහතික කර ඇති රසායනාගාරවලින් පමණක් සාම්පල පරීක්ෂා කිරීම කල යුතුව ඇත. ඒ අනුව 2020 අවසානය වන විට සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත. | රසායනාගාරය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව පර්යේෂණ සිදු කිරීම සඳහා අවශ්‍ය ජාත්‍යන්තර පිළිගත හැකි සහතික (accreditation) ලබාගැනීමට කටයුතු කළ යුතුය |
| එ) ආයතනය පිහිටුවීමේ අරමුණු අතර කෘෂිභෝගවල පශු අස්වනු හානිය අවම කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණක් වූ අතර ඒ වෙනුවෙන් 2009 වර්ෂයේ සිදුකර තිබූ මූලික සමීක්ෂණයකට අනුව කල්තබාගත නොහැකි කෘෂිභෝගවල පශු අස්වනු හානිය සියයට 30ත් 40ත් අතර පැවති බව හඳුනාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන්වන විට වසර 09ක පමණ කාලයක් ගතවී තිබුණත් මේ වනවිට පශු අස්වනු හානිය අවමකරගෙන තිබූ ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් කොපමණද යන්න හඳුනාගත හැකිවන අන්දමේ දත්ත සමුදායක් ආයතනය සතුව නොපැවතුණි. | 2013 වර්ෂයේදි බෝංචි හා කෙසෙල් යන බෝගයන්හි පසු අස්වනු හානිය නිර්ණය කිරීමට පරීක්ෂණයක් සිදුකර එම දත්තයන් ප්‍රකාශයට පත්කර ඇති අතර කෘෂි ආර්ථික වටිනාකමක් සහිත ප්‍රධාන බෝගයන්හි පසු අස්වනු හානිය නිර්ණය කිරීම සඳහා වන ක්ෂේත්‍ර සමීක්ෂණයක් ආරම්භ කර මේ වන විට එහි කටයුතු සිදු වෙමින් පවතී | පශු අස්වනු හානිය අවමකරගෙන තිබූ ප්‍රමාණය කොපමණද යන්න හඳුනාගත හැකිවන පරිදි ලේඛන පවත්වාගත යුතුය |

| | | |
|---|---|---|
| ඒ) 2015 වර්ෂයේදී මිලදී ගෙන තිබූ හා වර්ෂයකට රු.275,000ක නඩත්තු වියදමක් දරමින් පූර්ණ වායු සමන තත්වයක පවත්වාගෙන යන වටිනාකම රු. 15,216,575 ක් වූ Gas Chromatograph Mass Spectrometer (CGMS) යන්ත්‍රය මේ දක්වා ආයතනයේ කිසිදු කාර්යයක් සඳහා භාවිතා නොකොට නිෂ්කාර්යව පැවතුණි. | මෙම යන්ත්‍රය ඉදිරි වසරේදී පර්යේෂණ කටයුතු සඳහා භාවිත කිරීමට සැලසුම් කර ඇත. | මෙම යන්ත්‍රය ආයතනයේ ප්‍රයෝජනයට ගැනීමට හෝ එසේ නොහැකි නම් වෙනත් ඵලදායි ආයතනයකට ලබාදීමට කටයුතු කළ යුතුය. |
| ඔ) ආයතනය විසින් 2009 වර්ෂයේ සිට සිදු කරන ලද පර්යේෂණවල ප්‍රතිඵල ලෙස නව සොයාගැනීම් 08ක් සඳහා පේටන්ට් බලපත්‍ර ලබාගෙන තිබූ නමුත් එම නව සොයා ගැනීම් වලින් කෘෂිකර්ම හා පසු අස්වනු ක්ෂේත්‍රය ඔස්සේ රටේ ආර්ථිකයට සිදු කර තිබූ දායකත්වය කුමක්ද යන්න සනාථ කිරීමට අවශ්‍ය තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පර්යේෂණ වල ප්‍රතිඵල පේටන්ට් බලපත්‍ර ලබාගැනීමට පමණක් සීමා වී තිබුණු බව නිරීක්ෂණය විය. | පර්යේෂණ සමාජගත කිරීමේ කමිටුව නමින් කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව හරහා නිමකල පර්යේෂණ විග්‍රහයකට ලක් කර ක්ෂේත්‍රයට ලබාදීමට හැකියාව ඇති පර්යේෂණ තාක්ෂණ හා ප්‍රචාරණ අංශය මගින් ව්‍යාප්ත කෙරේ. එලෙසම තෝරාගත් තාක්ෂණයන් කිහිපයක් පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කොට උනන්දුවක් දක්වන පුද්ගලයන් වෙනුවෙන් වැඩමුලුවක් පවත්වා එම තාක්ෂණයන් ක්ෂේත්‍රයට ලබා දීමද සිදු වුනි. මේ යටතේ තාක්ෂණයන් 03ක් සමාජ ගත කිරීමට අවස්ථාවක් ලැබුණි. | ආයතනයේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් ආයතනයෙන් ලැබෙන දායකත්වය ප්‍රමානවත් නොවන බැවින් මෙම කරුණු කෙරෙහි නිසි අවධානය යොමුකළ යුතුවේ. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 11 ඡේදය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව කාර්ය මණ්ඩලය බඳවා නොගත යුතු අතර, එකී උපදෙස් අනුව කටයුතු නොකර සිදුකරන බඳවාගැනීම් සඳහා ආයතන ප්‍රධානියා හා මූල්‍ය අංශයේ ප්‍රධානියා වගකිව යුතු වුවද, ඊට පටහැනිව අනියම් සේවකයන් 10 දෙනෙකු බඳවාගෙන 2018 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් 31 දක්වා වැටුප් සහ දීමනා ලෙස රු.914,428ක් ගෙවා තිබුණි. | සම්මුඛ පරීක්ෂණ පවත්වා අතිරේක අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ ප්‍රචාරණ) ප්‍රධාන පර්යේෂණ නිලධාරී යන තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | |
|---|---|---|
| ආ) ආයතනයේ අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ සහ සංවර්ධන), ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි තනතුරු සමාලෝචිත වර්ෂය ආරම්භයේ සිට පුරප්පාඩුව පැවති අතර, විගණන දිනය වනවිට ඉහත නිලධාරින් ඇතුළු තාක්ෂණික කාර්ය මණ්ඩලයේ නිලධාරින් 07 දෙනෙකු පුරප්පාඩු වී පැවතුණි. | තවද පුවත්පත් දැන්වීම් පලකර බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ඉන් ප්‍රධාන තනතුරු වන අධ්‍යක්ෂ,අතිරේක අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්සණ ප්‍රසාරණ), ප්‍රධාන පර්යේෂණ නිලධාරී,ප්‍රධාන ව්‍යාප්ති නිලධාරී යන තනතුරු බඳවා ගැනීම් සිදු කර ඇත. අනෙක් තනතුරු සුදුසුකම් සපුරා ඇති අයදුම් කරුවන් ඉදිරිපත් වී නොතිබුණු අතර නැවත පුවත්පත් දැන්වීම් පළ කර ඇති අතර ජනාධිපතිවරණය අවසන් වූ වහාම බඳවා ගැනීමට නියමිතය | පවතින පුරප්පාඩු ඉක්මනින් පිරවීමට කටයුතු කළ යුතුය |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද්දේ 2019 ඔක්තෝබර් 02 දිනදීය. | මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් මස 30 වන විට සකස් කර අවසන් කලද 2019 පළමු රැස්වීම වන 2019 ජූලි 3 වන දින පවත්වන ලද 149 අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළද එහි උපදෙස් හා විගණන කළමණාකරණ කමිටුවේ නිර්දේශ සහිතව 2019 ජූලි 29 දින පවත්වන ලද 151 අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. නිර්දේශයන්ගේ අනුමැතිය 2019 සැප්තැම්බර් මස 30 දින පැවැති 151 අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලද වහාම එදිනම විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී. | මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුය |